# බළන්ගොඩ නගර සභාව

## 2025-08-12 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.08.12**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ 2025-07-08 දිනැති මහා සභා වාර්තාව සහ 2025-07-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2025-07-08 දිනැති මහා සභා වාර්තාව සහ 2025-07-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා ,2025-07-08 දිනැති මහා සභා වාර්තාව සහ 2025-07-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2025-07-08 දිනැති මහ සභාවේ සහ 2025-07-23 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා ගරු සභාවේ සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

අද දින ගරු සභාවට නිවේදන නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමාද සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා 2025-08-12 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම් ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**04. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

2025.09.13 දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩාංගනය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් SHIMA Event Management And Entertaintment ආයතනයේ ඩී.වී.සුජිත ශිරාන් දැල යන අය විසින් 2025/08/04 දිනැතිව යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ නගර සභා ක්‍රීඩා පිටිය සංගීත සංදර්ශන පැවැත්වීම සඳහා ලබා නොදීමට මින් පෙර සභාවන්වලදී තීරණයක් ලබා ගෙන තිබෙන බවත්, ඒ අනුව තමන් මෙම ඉල්ලීමට පෞද්ගලිකව විරුද්ධ බවයි.අනතුරුව සභාවේ මේ පිළිබඳ සාකච්ඡාවක් ඇති විය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා පැවසූයේ නගරයක් ලෙස මෙවැනි දේ පැවැත්වීමට ක්‍රීඩා පිටිය ලබා නොදෙන බැවින් සුදුසු ස්ථානයක් ලබා දීමට පියවර ගත යුතු බවත් ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරී ඉඩම පිළිබඳ එම ආයතනය සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගත යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ නගර සභා ක්‍රීඩා පිටිය මෙවැනි ප්‍රසංග සඳහා ලබා දීමට පාපන්දු ක්‍රීඩකයන් ආදී ක්‍රීඩා පිටියේ නිතර පුහුණුවීම් සිදු කරන අය විරුද්ධ වන බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ, ක්‍රීඩා පිටිය නිතර භාවිතා කරන අයවලුන්ගෙන් කිසිඳු ගෙවීමක් සභාවට නොකර සභාවේ ක්‍රීඩා පිටියේ සියළුම පහසුකම් නොමිලේ භුක්ති විඳින බවත්, නමුත් සභාව එය ආදායමක් ලබා ගැනීමට හැකි මාර්ගයක් බවට පත් කිරීමට යාමේදී ඔවුන් ඊටද විරුද්ධ වන බවත්, තමාගේ ධූරකාලයේ ක්‍රීඩා පිටියෙන් ලබා ගත යුතු උපරිම ආදායම සභාවට ලබා දීමට කටයුතු සිදු කරනු ලැබූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසූයේ මෙම ඉල්ලීම වෙනුවෙන් ක්‍රීඩා පිටිය තැන්පතුවක් ලබා ගෙන ලබා දිය යුතු බවත්, තමන් එයට එකඟ වන බවත්ය. ඒ අනුව ලක්ෂ 25 ක තැන්පතුවක් ලබා ගෙන ක්‍රීඩා පිටිය කොන්දේසි ඇතුළත් කර ගිවිසුම්ගතව ලබා දිය යුතු බවට ගරු සභාවේ සාකච්ඡා විය.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

**05:01:01** මුගුණමලය සුසාන භූමිය නගර සභාව වෙත පවරා ගැනීමේ වර්තමාන තත්වය කුමක්ද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, මුගුණමලය සුසාන භූමිය පවරා ගැනීම සඳහා එම ඉඩම මැනුම් කිරීමේ කටයුතුත්, අදාළ ආයතන මගින් එකඟතාව ලබා ගැනීමත් මේ වන විට අවසන් කර ඇති බවත් සුසාන භූමිය පවරා ගැනීමට අදාළ ඉදිරි කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වෙමින් පවතින බවත් පවසන ලදී.

**05:01:02** එච්.එම්. අයි උපාලි, 45/21, තොසිල ගාර්ඩන් යන අය 2024/05/27, 2024/07/30 ,2024/11/27 යන දිනවල සභාව වෙත ඉදිරිපත් කළ ලිපි මගින් ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව මේ වන තුරු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතුව කවරේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, එච්. එම්. අයි. උපාලි යන අය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ලට අදාළව අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා ලිපියත් සිහිකැඳවීම් ලිපිත් නිකුත් කර ඇති බවත්, ඒ අනුව ඔවුන් ක්‍රියා නොකිරීම හේතුවෙන් නගර සභාව මගින් එම ගස් කපා ඉවත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් පවසන ලදී.

වැඩිදුරටත් මේ පිළිබඳව ගරු සභාපතිතුමා කරුණු පැහැදිලි කරමින් මෙවැනි පැමිණිලි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ගැටළු පවතින බවත්, ගස් කැපීමේ කටයුතු කිරීම සඳහා සේවකයන් සභාවේ නොමැති බවත් ගස් හිමිකරුවන් අනතුරුදායක තත්වය ඉවත් නොකරන අවස්ථාවල සභාව මඟින් ගස් බිම හෙලීම සිදුකර අධිකරණ ක්‍රියාමාර්ග මඟින් මුදල් අයකර ගැනීමේ කටයුතු සිදු කරන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, එල්.ආර්.සී ඉඩම්වල පවතින අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ගතයුතු පියවර මොනවාදැයි විමසන ලදී.
ගරු සභාපතිතුමන් ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ අදාළ ආයතනවලට ලිපි යොමු කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා, තමන් විසින් කල් දී ඇති ප්‍රශ්න යටතේ යොමු කර ඇති 05:01:01ට අදාළව මුගුණමලය සුසාන භූමිය ඉඩම පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලද ලිපියේ දිනය කවදාද යන්නත්, 05:01:02ට අදාළ පැමිණිල්ල සම්බන්ධව ගසෙන් අනතුරක් සිදු වුවහොත් එම වගකීම භාර ගන්නේ කව්රුන්ද යන්නත් විමසන ලදී.

ගරු සභාපතිතුමන් පැවසූයේ සභාව විසින් දැනුම් දී තිබියදී අදාළ පාර්ශවයන් ගස් කපා අනතුරුදායක තත්වය ඉවත් කර නොගන්නේ නම් සභාව ගස් කපා වියදම අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ කටයුතු සිදු කරන බවත් අවශ්‍ය නීත්‍යානුකූල පියවර ගන්නා බවත්ය.

**05:01:03** වැලිහරනාව මාර්ගයේ ජලසම්පාදන මණ්ඩලය මඟින් කැනීම් කර බට එලා ඇති අතර එය කොන්ක්‍රීට් කර යථා තත්වයට පත් නොකරන හේතුව කුමක්ද?
ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, වැලිහරනාව මාර්ගයේ මාර්ග පළුදු කර බට කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් විමසූ බවත්, එම ආයතනය විසින් වැලිහරනාව මාර්ගය අගෝස්තු මස 31 දිනට පෙර කොන්ක්‍රීට් කර අවසන් කරන බව දැන්වූ බවත් පවසන ලදී.

**05:01:04** එම මාර්ගය කැනීම් කිරීම සඳහා තැන්පතු වශයෙන් කොපමණ මුදලක් නගර සභාව ලබාගෙන තිබේද?
මාර්ග පළුදු කිරීම සඳහා තබා ගත් තැම්පතු මුදල රු.1,098,396.00 (ලංකා බැංකුවේ චෙක්පත් අංක 499444)

**05:02 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**05:02:01** ශෛලතලාරාමය මාර්ගය කාපට් කිරීමෙන් අනතුරුව නගර සභාව වෙත එම මාර්ගය භාරදී තිබේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා මෙම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාපට් කර ඇති බවත්, භාර දී ඇති බවට ලිඛිත සාක්ෂි නොමැති බවත් පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉහත කී මාර්ගය කාපට් කිරීම සිදු කළ බවත්, සභාවට අයත් මාර්ග කාපට් කිරීමේදී සභාවේ අධීක්ෂණයක් සිදු කළ යුතු බවත්, ඒ අනුව එම වාර්තා සභාවෙන් ලබා දී ඇති බවත්, තමාගේ ධුරකාලයේ මෙම මාර්ගය සභාව වෙත භාරගන්නා ලෙසට ගරු ආණ්ඩුකාරතුමන් දැනුම් දෙන ලදුව මාර්ග සභාව වෙත භාර ගත් බවත්ය.

**05:02:02** ශෛලතලාරාමය මාර්ගයේ රැදවුම් මුදල් මුදා නොහරින ලෙස පසුගිය සභා වාරයකදී යෝජනා කරා එම රැදවුම් මුදල් කොන්ත්‍රාත් කරුවන් වෙත නිදහස් කර තිබේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, ශෛලතලාරාම මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාපට් කර ඇති අතර රැදවුම් මුදල් කොන්ත්‍රාක්කරුවන් වෙත නිදහස් කිරීමේ කටයුතු එම ආයතනය මගින් සිදු වේ.

**05:03 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**05:03:01** පසුගිය මාසය තුළ දුන් යෝජනා වල ප්‍රගතිය කෙසේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා ,පසුගිය මාසයේ කර්මාන්ත කාරක සභාවේ ප්‍රමුඛතා ගත වූ යෝජනා සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බවත් , මුදල් කාරක සභාවේ නිර්දේශය ලැබී ඇති බවත් පැවසීය.

**05:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

**05:04:01** පසුගිය මස සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත වූ යෝජනා වල වර්තමාන ප්‍රගතිය කෙසේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, සම්බන්ධීකරණ කමිටුව වෙත යොමුකිරීමට යෝජනා වූ යෝජනා  එම කමිටුව වෙත යොමු කරන ලද බවත්, අනෙකුත් යෝජනා ඉදිරි සංවර්ධන කටයුතු වලදී සලකා බලන බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව කාර්මික නිලධාරී මහතාගෙන් වැඩිදුරටත් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

**05:05 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**05:05:01** 2025 වර්ෂයේ ඉදිරි මාස කිහිපය සඳහා පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා, 2025 වර්ෂය සඳහා අයවැයක් ඉදිරිපත් කර ඇති බැවින් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් එසේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්නේ නම් වෙනම ආදායම් ප්‍රභවයන් පෙන්විය යුතු බවත් පැවසීය.

මෙහිදී, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, පසුගිය සභාවාරයේදී පැවසූ ආකාරයටම සම්මත වූ අයවැයක් පවතීනම් ප්‍රාග්ධන අරමුදල්වල ශේෂය හා පුනරාවර්තන වියදම් වල ශේෂය, ඒ අනුව මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා වෙන් කළ හැකි මුදල ආදී ලෙස විස්තරාත්මකව තොරතුරු අවශ්‍ය බව පවසන ලදී.

ඒ අනුව මේ පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

**පෙ.ව.10.26 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

**05:05:02** මැණික් කඩ කාමර අංක 08 වර්තමාන බදුකරු කවුරුන්ද?

මැණික් කඩ කාමර අංක 08 වර්තමාන බදුකරු වන්නේ ඩබ්.ඩබ්.ලුසියා මහත්මිය වේ.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති කේ. පී.ප්‍රේමදාස මැතිතුමා**

**06:01:01** කර්මාන්ත සහ නඩත්තු කටයුතු සඳහා මිළදී ගත් තාර සඳහා බිටුලින්ක් ඉමල්ෂන් පුද්.සමාගම වෙත රු. 746,350.00 ක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:02** සභාව සතු 227-5020 අංක දරණ ගලී බවුසරය අලුත්වැඩියා කිරීම යටතේ ගලි ටැංකිය සහ අනෙකුත් අලුත්වැඩියා සිදුකිරීම සඳහා තෙබුවන ගරාජ් මඟින් ඉදිරිපත් කර ඇති රු.646,530 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසුයේ තෙබුවන ගරාජය මගින් වසර ගණනාවක සිට බලන්ගොඩ නගර සභාවට අයත් වාහන අලුත්වැඩියා කරන බවත්, එම ගරාජය මගින් පමණක් අලුත්වැඩියා සිදුකිරීම ගැටළුවක් විය හැකි බවත්, වෙනත් එවැනි ආයතන සොයා බලා එම ආයතන වලින් ද සේවාවන් ඉටුකරගැනීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය ඉහත යෝජනාවේ සඳහන් කර ඇති ගලි ටැංකිය එක් වරක් අලුත්වැඩියා සිදුකලා නේද යන්නත් නැවතත් එම අලුත්වැඩියාවම සිදුකරන්නේ ඇයි ද යන්නත් විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමාද ඉහත සඳහන් කර ඇති ගලි බවුසරයේ අලුත්වැඩියාවට අදාළව ගලි ටැංකිය වසරකට පෙරත් අලුත්වැඩියා කළ බවද, එසේ තිබිය දී නැවතත් අලුත්වැඩියා කරන්නේ ඇයි ද යන්නත්, එම අලුත්වැඩියාව සිදුකළ ආයතනයෙන් ඊට අදාළව වගකීම් කාලයක් ලබානොදෙන්නේ ඇයි ද යන්නත්, එම අලුත්වැඩියාවෙන් පසු ගලි බවුසරය ධාවනය කරන ලද කිලෝ මීටර් ගණන කොපමණ ද යන්නත්, විමසන ලදී.

ඉහත සියළු ගැටළු සඳහා පිළිතුරු ලබාදීම වෙනුවෙන් කාර්මික නිලධාරී මහතාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උපසභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව පැවති කාරක සභාවේ දීර්ඝ පැහැදිලි කිරීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත්කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින්, ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

**06:01:03** සභාව සතු අංක දරණ ZA 5039 JCB රථය අලුත්වැඩියා කිරීම සඳහා ඇවන්ස්මාර්ට් ඉන්ජිනියරින් මගින් ඉදිරිපත් කර ඇති රු.508,934.37 ක ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින්, ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:04** 2025 ජුලි මස අනියම් ආදේශක වැටුප් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාගැනීම.

01. සෞඛ්‍ය අංශය රු.1,329,362.81
02. කර්මාන්ත අංශය රු.416,145.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත ඉදිරිපත් කර ඇති වැටුප් පිළිබඳ විස්තරාත්මක තොරතුරු අවශ්‍ය බව පවසන ලදුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.
අනතුරුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින්, ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.01:05** දීමනා මත ගිවිසුම් ගත වී ඇති බෝම්බුව සහ වැවේවත්ත නගර සභා පෙර පාසල් පාලිකා දීමනාව රු. 25,000 ක් දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පවසා සිටියේ වර්තමාන ආර්ථික තත්වය හමුවේ දැනට මෙම පෙර පාසල් පාලිකාවන්ට ගෙවනු ලබන රු.15,000 ක දීමනාව ප්‍රමාණවත් නොවන බවත් එබැවින් එකී දීමනාව රු.25,000 දක්වා වැඩි කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් මඟින් ගරු ආණ්ඩුකාරතුමිගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සිදු කළ යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, 2018 වර්ෂයේදී සභා තීරණයක් මත මෙම දීමනාව අවසන් වරට රු.15,000 දක්වා වැඩි කර ඇති බවත් මෙම යෝජනාව අනිවාර්යයෙන් ක්‍රියාත්මක කළ යුතු බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ කල් දී ඇති යෝජනා වලද මෙම යෝජනාව අන්තර්ගත වූ බවයි.

ඒ අනුව විරෝධතා නොමැති හෙයින් දැනට දීමනා මත ගිවිසුම් ගත වී ඇති බෝම්බුව සහ වැවේවත්ත නගර සභා පෙර පාසල් පාලිකා දීමනාව රු. 25,000 ක් දක්වා වැඩි කිරීමටත්, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස් මඟින් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**06:01:06** සම්පත් පියස පිහිටි ගොඩනැගිල්ලේ උඩු මහල භූමිය දැන්වීම් පුවරුවක් සවිකිරීම සඳහා බදුදීම වෙනුවෙන් අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් දැන්වීම් පුවරු ස්ථාපිත කිරීමට යෝජිත ස්ථානය සුළං වලින් අවධානම් විය හැකි ස්ථානයක් බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් දක්වා ඇති ස්ථානයේ කඩ කාමර ඉදිකර සභාවට ආදායම් ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මීට පෙර සභාවන් වලදී යෝජනා වූ පරිදි ඉහත කී ස්ථානයේ LED පුවරුවක් සවි කර ආදායම් ලබා ගත හැකි බවත් පවසන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසූයේ සම්පත් පියස පිහිටි ඉඩමේ අයිතිය නිශ්චිතවම බලන්ගොඩ නගර සභාව සතු නොවන බැවින් කඩ කාමර ඉදිකිරීම වැනි සංවර්ධන කටයුතු සිදු කළ නොහැකි බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින්, ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:07** 2025 පුහුණු සැලැස්මට අනුව පහත සඳහන් පුහුණු වැඩ සටහන් සිදුකිරීම සඳහා අනුමැතිය ලබාගැනීම.

01. ගිනි නිවීම හා උපකරණ භාවිතය සඳහා වන පුහුණු වැඩසටහන
02. හදිසි විදුලි,ජලනල අලුත්වැඩියාව සහ පැස්සුම් ශිල්ප පුහුණුව, මෝටර් කාර්මික පුහුණුව
03. ප්‍රථමාධාර පුහුණු , ප්‍රජා සෞඛ්‍ය හා පිරිසිදුකම, සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩ සටහන.
04. පරිඝණක දැනුම හා අන්තර්ජාල පුහුණුව

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා, මෙම පුහුණු වැඩසටහන් සඳහා අයවැය මඟින් වෙන්කිරීම් සිදු කර ඇත්ද යන්නත් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය, මෙම පුහුණු නවක නිලධාරීන් සඳහාද යන්නත් ප්‍රශ්න කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පවසා සිටියේ මෙම පුහුණු සඳහා වන වියදම් 2025 අයවැය මඟින් ප්‍රතිපාදක වියදම් විය යුතු බවයි.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉදිරිපත් කර ඇති පුහුණු වැඩසටහන් සඳහා 2025 වර්ෂයේ අයවැය මඟින් මුදල් ප්‍රතිපාදන සිදු කර ඇති බවත් නිලධාරීන් වෙනුවෙන් මෙම පුහුණු අවස්ථා ලබා දිය යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින්, ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:08** බළන්ගොඩ තොටුපලතැන්න වසමේ පදිංචි එස්.සුබ්‍රමනියම් යන අය මේ වන විට තම ජීවනෝපාය මාර්ගය වශයෙන් වඩ වෙළඳාම් කටයුතු සිදුකරගෙන යන බවත්, ඔහුගේ ව්‍යාපාරික කටයුත්ත සාර්ථක කරගැනීම සඳහා දොරවෙල පාලම අසල පවතින රා කඩය අසල ජංගම රථයක් තබාගනිමින් වෙළඳාම් කටයුතු සිදුකිරීමට අවසර ඉල්ලා සිටින බැවින්, අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරදෙන ලෙස බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් යොමු කර ඇති 7/1 6/6/45x දරණ ලිපිය පිළිබඳව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමන් මෙම ඉල්ලීමට පෞද්ගලිකව විරුද්ධ බවත් සභාවේ මේ පිළිබඳව පවත්නා අදහස ලබා දෙන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ, සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ සලකා බැලීමේදී, ඉහත වඩ වෙළඳාම සිදු කිරීමට මාර්ගයක් අසල ලබා දීම සිදු කළ නොහැකි බවත්, ප්‍රාදේශීය ලේකම් මෙවැනි ඉල්ලීම් කිරීමේදී සැලකිලිමත් විය යුතු බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ඉල්ලීම පිළිබඳව ගරු සභාවේ විරෝධතාවය ප්‍රකාශ කළ බැවින් ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීම සුදුසු බවයි.

**ඒ අනුව ඉහත ඉල්ලීම ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.**

**06:01:09** 2025 වර්ෂයේ බළන්ගොඩ නගර සභා සීමාවට අයත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී ක්ෂේත්‍ර වලට අදාලව පැවැත්වීමට නියමිත සායන හා වැඩ සටහන් සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් දායකත්වය ලබාදෙන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය බළන්ගොඩ මගින් යොමු කර ඇති ඉල්ලීම සඳහා අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව ගරු සභාවේ මතය වූයේ 2025 වර්ෂයේ අගෝස්තු මස සිට ඉදිරි මාස කිහිපය සඳහා අයවැය මගින් මාතෘ හා ළමා ආරක්ෂණ සේවා වෙනුවෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන භාවිතා කර ඉහත වැඩසටහන් සඳහා සංග්‍රහ දායකත්වය ලබා දීම සුදුසු බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:10** නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ නව බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදල් සඳහා 2023 ජනවාරි මස දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් ඉදිරිපත් කරන ලද ණය ක්‍රමක්ෂය

ලේඛනය අනුව ණය වාරිකය හා පොළිය මාසිකව ස්ථාවර නියෝග මගින් 2034 ඔක්තෝබර් මාසය දක්වා ගෙවීමට අනුමැතිය ලබාගැනීම. ( මාසික වාරිකය රු.769,680.36 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ 2034 වර්ෂය දක්වා ඉහත ණය මුදල ගෙවීම් කිරීම වෙනුවෙන් මෙම සභාවේ අනුමැතිය ලබා දිය නොහැකි බවයි.

ඒ අනුව ගරු සභාව ඊට එකඟතාවය පළ කල බැවින් නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ නව බස්නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදල් සඳහා 2023 ජනවාරි මස දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් ඉදිරිපත් කරන ලද ණය ක්‍රමක්ෂය ලේඛනය අනුව ණය වාරිකය හා පොළිය මාසිකව (මාසික වාරිකය රු.769,680.36) ස්ථාවර නියෝග මගින් මෙම සභාවේ ධූරධාරීන්ගේ ධූරකාලයක ක්‍රියාත්මක වන තෙක් පමණක් ගෙවීම් කිරීම සඳහා වන සංශෝධිත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:11** නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘති ආධාර යටතේ වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය අංක 2004/0046-R01 දරණ ණය මුදල සඳහා 2023 ජනවාරි මස දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් ඉදිරිපත් කරන ලද ණය ක්‍රමක්ෂය ලේඛනය අනුව ණය වාරිකය හා පොළිය මාසිකව ස්ථාවර නියෝග මගින් 2028 මාර්තු මාසය දක්වා ගෙවීමට අනුමැතිය ලබාගැනීම.( මාසික වාරිකය 114,767.60 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත ණය මුදල ගෙවීම් කිරීම වෙනුවෙන් 2018.12.13 දිනැති මහ සභාව මෙම ණය මුදල වාරික 108කින් ගෙවීම් කිරීමටත්, 2018.05.21 දිනැති මහ සභාව මෙම ණය මුදල වාරික 112 කින් ගෙවීම් කිරීමටත් අනුමැතිය ලබා දී ඇති බැවින් ඉහත ගෙවීම පිළිබඳ තීරණය කලින් ගෙන ඇති බවත්, නැවත අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය වන්නේද යන්නත්, මෙම ණය මුදලට වඩා පොළිය ගෙවීමක් සිදුවී ඇති බවත්, 2007 සභාව මගින් මෙම ණය මුදල නොගෙවීමට තීරණය කර ඇති බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ 2018 සභාව මගින් ගෙවීම් තීරණය ලබා ගත්තද, නව සභා වාරයක් ආරම්භ වූ බැවින් එම ගෙවීම් තීරණය යාවත්කාලීන කළ යුතු බවත්, 2007 සභාව මගින් මෙම ණය

ගෙවීම අතිහිටුවීම පිළිබඳ නඩු විභාගයක් සිදු වී ඇති බවත්, එමගින් සභාව පරාජයට පත්වීම හේතුවෙන් නැවත ණය මුදල පොලියත් සමඟ ගෙවීමට සිදු වී ඇති බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:12** වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමට ගත් ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් ණය අංක 2004/0046-02 ට අදාළ ක්‍රමක්ෂය ලේඛණ ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒ සඳහා 2025.05.19 දින නව ක්‍රමක්ෂය ලේඛණයක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව රු.145,344.42 ක් වන ණය වාරිකය 2028 මැයි මාසය දක්වා ගෙවීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:13** 2025.07.15 දින සිට 2025.07.31 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් ටෙන්ඩර්කරුවෙත රු.525,000 ක් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:14** බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ ටෙන්ඩරය 2024.11.01 දින සිට 2025.10.31 දින දක්වා ක්‍රියාත්මක වේ. කසළ ටෙන්ඩර්කරු වෙත රු.1,050,000 ක් මාසිකව ගෙවිය යුතු අතර මුදල් කාරක සභාවේ වියදම් සීමාව රු.500,000 කි.ඒ අනුව මුදල් කාරක සභාවේ නිර්දේශය මත කසළ ටෙන්ඩර්කරු වෙත දින 15 ක් වෙනුවෙන් රු.525,000 ක් ගෙවීම සිදු කළ නොහැකි බැවින් 2025.10.31 දින දක්වා කසළ ටෙන්ඩර්කරු වෙත සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මුදල් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:15** බළන්ගොඩ නගර සභාවේ අනියම් ආදේශක පදනම මත සේවයෙ කරන සේවකයින්ට 2025 වර්ෂයේ දෙසැම්බර් දක්වා දෛනික වැටුප්, සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:16** බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසල අංක : 05 දරණ එළවළු කඩ කාමරය 2025 ජුනි 01 වන දින එල්.ඒ.නිමල් සෝමරත්න මහතා විසින් බදු පදනම මත ලබාගෙන ඇත. නමුත් එම මහතා මෙම කඩ කාමරය තව දුරටත් සිදුකරගෙන යා නොහැකි බැවින්, සභාව වෙත පවරා ගන්නා ලෙස 2025.07.27 දිනැතිව ඉල්ලීමක් යොමුකර ඇත. ඒ අනුව, මෙම කඩ කාමරය සභාව වෙත පවරා ගැනීමටත්, මාසික කුළී මුදල් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වලින් හිලව් කිරීමටත් ඉන් අනතුරුව තක්සේරුගත මාසික ලංසු මුදල රු.12,500 ක මුදල මත පදනම්ව මෙම කඩ කාමරය නැවත ටෙන්ඩර්කර සුදුසු බදුකරුවෙකු තෝරා ගත යුතුය. ඒ සඳහා,

- මාසික අවම ටෙන්ඩර් මුදල
- ටෙන්ඩර් ක්‍රමවේදය (ප්‍රාදේශීය/ දේශීය ටෙන්ඩර් ද)
- වෙනත් විශේෂ කොන්දේසි යන ආදිය තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත කඩ කාමරයේ තමාගේ පියා සහ සීයා වෙළඳාම් සිදු කළ බවත්, මෙම කඩ කාමරයේ මාසික කඩ කුලිය ගෙවීමට ප්‍රමාණවත් වෙළඳාමක් සිදු නොවන බැවින් කඩ කාමරය සභාව වෙත පවරා දුන් බවත්, තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් මෙම කඩ කාමරය තක්සේරු කිරීමේදී දිග පළල අනුව තක්සේරු කිරීම් සිදු කරන බැවින් අවාසියක් සිදු වන බවත්, පොදු වෙළඳසැළ භූමියේ වෙළඳාමක් පවතින්නේ මාළු මස් සඳහා පමණක් බවත්, දැනට එම ගොඩනැගිල්ල ඉතාම ජරාජීර්ණ වී ඇති බවත්ය.

මෙහිදී ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ පොදු වෙළඳසැළ නවීකරණය කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන මේ වන විට ඉල්ලුම් කර ඇති බවත්,ඒ අනුව ඉදිරියේදී සංවර්ධන කටයුතු සිදු වනු ඇති බවත්, ඉහත පොදු වෙළඳසැළ අංක 05 කඩ කාමරයේ දැනට පවත්නා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති තක්සේරුව මත පදනම් වී ඇති අවම ලංසු මුදල අඩු කිරීමේ හැකියාවක් නොමැති බවත්ය.

ඒ අනුව, මෙම කඩ කාමරය සභාව වෙත පවරා ගැනීමටත්, මාසික කුළී මුදල් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වලින් හිලව් කිරීමටත් ඉන් අනතුරුව තක්සේරුගත මාසික ලංසු මුදල රු.12,500 ක මුදල මත පදනම්ව මෙම කඩ කාමරය නැවත ටෙන්ඩර්කර සුදුසු බදුකරුවෙකු තෝරා ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ක්‍රමවේදය මඟින් ටෙන්ඩර් කැඳවීම් කටයුතු සිදු කිරීමටත් වන යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:17** බලන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපනශාලාවේ බදු කාලය 2025 නොවැම්බර් මස 30 වන දිනෙන් අවසන් වන අතර 2025 දෙසැම්බර් මස 01 වන දින සිට 2026 නොවැම්බර් මස 30 වන දින දක්වා වූ කාලය සඳහා ටෙන්ඩර් ක්‍රමවෙද මගින් බදුකරුවන් තෝරා පත්කර ගැනීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:18** බලන්ගොඩ නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11:(1) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:19** බලන්ගොඩ නගර සභාව සතු කීමනි පදනම මත ලබානොදුන් කඩ කාමර 160 ක් පවතින අතර වාර්ෂික ගිවිසුම් අත්සන් කරමින් එකී කඩ කාමර වල අයිතිය පවත්වාගෙන යනු ලබයි. එහෙත් බදුකරු මියගිය අවස්ථාවන් හි දී අනුප්‍රාප්තිකයාට බදු අයිතිය පැවරිය නොහැකි තත්ත්වය මත දැනට ගැටළු රාශියක් පැනනැගී ඇත. මෙම ගැටළු හේතුවෙන් කඩහිමියන් විසින් ඔවුන්ගේ ව්‍යාපාරය පිළිබඳ ඇති අවිනිශ්චිතතාවය මත වාර්ෂික ගිවිසුම් පදනම වෙනුවට දිර්ඝකාලීන බදු පදනම මත ගිවිසුම්ගත වීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලීම් ලිපි යොමුකර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව ලේකම්තුමියගෙන් වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව, ඉහත කී කඩ කාමර සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ගිවිසුම්ගත වීමටත් කී මනි මුදල එකවර ගෙවීම් කළ හැකි බදුකරුවන්ගෙන් එකවර අයකරගැනීම සුදුසු බවටත්, එසේ හැකියාවක් නොමැති බදුකරුවන්ගෙන් කී මනි මුදල වාරික වශයෙන් අයකරගැනීම සුදුසු බවටත් වන ගරු සභාපතිතුමන් විසින් කරන ලද සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**06:01:20** බළන්ගොඩ නගර සභාවේ සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් ලෙස වතුපල්ලේ විදානෙලාගේ ධර්මරත්න යන අය බඳවා ගැනීමටත්, සබරගමුව පළාත් පාලන කොමසාරිස් CLG/LG/02/16/2019 චක්‍රලේඛය ප්‍රකාරව මාසික රු. 15,000 ක දීමනාවක් සභා අරමුදලින් ගෙවීම් කිරීමටත් අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:21** පහත සඳහන් කර්මාන්ත (පළාත් සභා අරමුදල්) සඳහා අනුඥාත නිවේදන ලැබී ඇත.එකී කර්මාන්ත ඉටු කිරිම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.

01. වීරසුන්දරාරාම මාර්ගයේ පේළි නිවාස පිටුපස කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම රු.484,846.26

02. මාළිගාතැන්න ලහිරු වෙළඳසැල අසලින් ඉහලට යන මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම රු.974,395.55

03. බළන්ගොඩ නගර සභා පුස්තකාලයේ අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීම රු.1,970,375.40

04. බළන්ගොඩ නගර සභා මහජනපොළ වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම රු.1,852,101.42

ඉහත සඳහන් කර්මාන්ත ඉටු කිරීමටත්, ප්‍රජා පාදක සංවිධාන මඟින් කර්මාන්ත ඉටුකිරීමටත් වන යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පැවසුයේ නව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකරන්නේ නම් ඉහත බළන්ගොඩ නගර සභා පුස්තකාලයේ අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීම යන කර්මාන්තය සිදු කිරීම පිළිබඳ සලකා බැලිය යුතු බවයි.

ඒ අනුව ඉහත බළන්ගොඩ නගර සභා පුස්තකාලයේ අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීමේ කර්මාන්තයේ වැඩ විස්තරය පිළිබඳ කාර්මික නිලධාරිගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:22** පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා කර්මාන්ත කාරක සභාවේ නිර්දේශය ලැබී ඇති බැවින් එකී කර්මාන්ත ඉටු කිරිම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.

01.බෝම්බුව පහළ මස්සැන්න මාර්ගය සංවර්ධනය කිරීම රු.909,000.00
02. දෙහිගස්තලාව තලාව මාර්ගය ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම රු.580,000.00
03. කිරිදිගල ජනපද මාවත සංවර්ධනය කිරීම රු.780,000.00

ඉහත සඳහන් කර්මාන්ත ඉටු කිරීමටත් එකී කර්මාන්ත ඉටු කිරීම ප්‍රජාපාදක සංවිධාන මඟින් සිදුකිරීම සඳහාත් වන යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**06:01:23** පහත සඳහන් කර්මාන්ත බිල්පත් සඳහා ගෙවීම් කටයුතු සිදු කිරිමට සහා අනුමැතිය ලබා ගැනීම.

**01.**අනඳමෙත්ගම මාර්ගයේ පැති බැම්ම හා ජලාපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම කර්මාන්තයට අදාළ අවසන් බිල්පත - රු.831,304.40 (පළාත් සභා අරමුදල්)
**02.**බෝම්බුව වතුකාරගොඩ (පරගහ කුඹුර) මාර්ගය සංවර්ධනය කිරිම අවසන් බිල්පත ගෙවීම රු.1,668,116.75 (සභා අරමුදල්)
**03.**බළන්ගොඩ නගර සභා ළමා උද්‍යානය වැඩි දියුණු කිරීම අවසන් බිල්පත ගෙවීම රු.897,237.75
**04.**බැංකියවත්ත ගලි අප ජලය පිරිපහදු ටැංකිය වැඩි දියුණු කිරිම අවසන් බිල්පත ගෙවීම රු.618,793.44

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මෙම යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් පවසා සිටියේ ඉහත අනඳමෙත්ගම මාර්ගයේ පැති බැම්ම හා ජලාපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම කර්මාන්තයට අදාළව සිදුකරන ලද පැමිණිල්ලකට අදාළව පරීක්ෂණයක් සිදු කිරීමට පවතින බවට පළාත් පාලන කොමසාරිස් දැනුම් දී ඇති බැවින් එම කර්මාන්තයට අදාළ බිල්පත නොගෙවා සිටීමට සිදු වන බවත්, එය හැර අනෙකුත් බිල්පත් ගෙවීම් වෙනුවෙන් අනුමැතිය ලබා දෙන ලෙසත්ය. ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ගරු සභාපතිතුමාගේ සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**06:01:24** බළන්ගොඩ බස්නැවතුම්පළ සහ මහජනපොළ පොදු වැසිකිළි නඩත්තු කිරීම, පිරිසිදු කර ගාස්තු අයකරගෙන පවත්වාගෙන යාමේ ටෙන්ඩරය සහ බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම, පිරිසිදු කිරීමේ පවත්වාගෙන යාමේ ටෙන්ඩරය 2025/10/31 දිනෙන් අවසන් වන බැවින්, 2025/11/01 සිට 2026/10/31 දින දක්වා එම ටෙන්ඩර් නැවත කැඳවීමට අනුමැතිය ලබාගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:01:25** ඉම්පීරියල් ඉදිරිපිට කඩ පේලියේ කඩ කාමරවල දැනට සිටින කඩ හිමියන් සමඟ සභාව නීත්‍යානුකූලව ගිවිසුම්ගතවීමට අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවට අදාළව එකී කඩවල හිමිකාරත්වය පිළිබඳ සභාවේ ප්‍රශ්න කළ බැවින් ගරු ඒ පිළිබඳ ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යේජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ මෙම කඩ පෙළෙහි හිමිකාරිත්වය පිළිබඳව සාකච්ඡා කර විසඳුමක් ලබා ගැනීම සුදුසු බවට සභාව එකඟතාවය පළ කල බැවින් ගරු සභාපතිතුමා, ඉම්පීරියල් ඉදිරිපිට කඩ පේලියේ හිමිකම පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් සිදු කිරීමට

ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**06:01:26** සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය ලබා දිය යුතු සභිකවරුන් දෙදෙනෙකු තීරණය කිරීම.

සභාපති අරමුදලින් ගෙවීම් කිරීම වෙනුවෙන් චෙක්පත් අත්සන් කිරීම සඳහා බලය ගරු සභාපති සහ උප සභාපති වෙත පැවරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**06:01:27** බලන්ගොඩ නගරයේ ප්‍රධාන වීදිය දෙසින් ප්‍රධාන බස්නැවතුම්පලට ප්‍රවේශ වන මාර්ගයට යාබදව ඉදිකර ඇති කඩ කාමර අංක 183/1 සිට 183/6 දක්වා වූ කඩ කාමර 06 හේතුවෙන් පදික වේදිකාව භාවිතා කරන්නන්ට අවහිරයක් වන බවට යොමුකර ඇති පැමිණිල්ලකට අදාළව පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG/07/05/01 අංක දරණ ලිපිය සම්බන්ධව ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා ඉහත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලෙන් දක්වන පරිදි කඩ කාමර හේතුවෙන් කිසිඳු පදික වේදිකාව අවහිරයක් සිදුවීමක් නොවන බවත්, ඒ අනුව ඒ බව දැන්වීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පැවසූයේ, ඉහත ස්ථානයේ කඩ කාමර හේතුවෙන් කිසිම අවහිරයක් සිදු නොවන බවත් වාහන නැවැත්වීම හේතුවෙන් පදික වේදිකාව අවහිර වන බවත්, ඒ අනුව එම ස්ථානයේ පදික වේදිකාවේ වාහන නැවැත්වීම පාලනය කිරීම වෙනුවෙන් කහ ඉරක් ගැසීම හෝ ඔත්තේ ඉරට්ටේ ලෙස දින බෙදා වාහන නැවැත්වීමට අවසර ලබා දීම සිදු කළ යුතු බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ පදික වේදිකාවේ වෙළඳුන් සහ නගරයේ රථවාහන නැවැත්වීම පිළිබඳව පොලීසිය, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ආයතන සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්, ඒ අනුව ඉහත ලිපිය මඟින් යොමු කර ඇති කාරණාවට එකඟ නොවන බවත්,ඒ බව පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කරන බවත්ය.

**06:01:28** 2026 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් දේපල ටෙන්ඩර් කිරීම .

බළන්ගොඩ නගර සභාවට අයත් පොදු වෙළඳසැල අංක 15,16,17 දරන මස් කඩ, පොදු වෙළඳසැල අංක 09,10,11,12,14,18 දරන මාළු කඩ, පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම සහ බළන්ගොඩ නගරයට රථ වාහන ඇතුළු කිරීමේ හා නැවතුම් ගාස්තු අය කිරීමේ බදු අයිතිය ලබා දීමට අදාල ටෙන්ඩර් 2025.12.31 දිනෙන් අවසන් වේ. එම නිසා 2026 වර්ෂය සඳහා සුදුසු බදු කරුවන් තෝරා පත් කර ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම සිදු කල යුතුය.ඒ අනුව 2024.11.19 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තක්සේරුව මත ටෙන්ඩර් කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සහ ටෙන්ඩර් කොන්දේසි වෙනස් විය යුතු නම් ඒ සම්බන්ධයෙන් ද අවම මාසික ටෙන්ඩර් මුදලද තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා 2026 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් දේපල ටෙන්ඩර් කිරීම සඳහා වන යෝජනාව ස්ථිර කරන බවත්, ඒවායේ අවම ලංසු මුදල සහ ටෙන්ඩර් කොන්දේසි පිළිබඳ තීරණය කිරීම ඉදිරි සභාවක් මඟින් සිදු කිරීම සුදුසු බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසුයේ රජයේ නිවාඩු දිනයන් වලට මෙම කඩ කාමරවලින් අයකරන ගාස්තු නිදහස් කළ යුතු බවයි.

ඒ අනුව විරෝධතා නොමැති බැවින් 2026 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් ඉහත දක්වා ඇති දේපල ටෙන්ඩර් කිරීම සඳහා වන යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:01:29** නො.92/1, පෙට්ටිගල පාර, බළන්ගොඩ යන ලිපිනයේ පදිංචි ඩබ්.එම්.ආරියදාස වීරසිංහ යන අය තම නිවෙස්වලට යන මාර්ගයට නමක් නොමැති බැවින් මාර්ගය සහිත ඉඩමේ නමට අදාළව එම මාර්ගයට "පූජාපිටිය මාර්ගය" යනුවෙන් නම් කර පුවරුවක් සවි කර දෙන ලෙස යොමු කර ඇති ඉල්ලීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**ගරු සභාපතිතුමා ප.ව.1.02 ට පමණ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා වෙත මූලාසනය භාර දෙන ලදී.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:01:01** පහත සඳහන් කරුණු ඇතුළත් කොට අංක 06 කාර් පාක් කඩ කාමරය පවරා දීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට ගරු ආණ්ඩුකාරතුමියට අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව, ජනාධිපති විමර්ශන කොමිසම වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කිරීමටත් යෝජනා කරමි.

- එවකට සභාව ගනු ලැබූ තීරණය ආණ්ඩුකාරවරයා වෙත දැනුම් නොදී වෙනත් කරුණු ඇතුළත් කර යැවූ ලිපිය

- අතුරු බදු දීමක් සිදු කර ඇති බව අනාවරණය වී තිබියදී එම කඩ කාමරය සභාව වෙත පවරා නොගැනීම.
- සභාව මඟින් නිකුත් කරන ලද රිසිට් පත් නම් වෙනස් කර වංචනික රිසිට් පත් මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් යන කරුණු

**07:01:02** මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ගල්වල අසළ නායයෑමකට ලක්ව ඇති බැවින් එම කරුණ මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීමට හා ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**07:01:03** නිවාස සංවර්ධන අධිකාරිය සතු අනඳමෙත්ගම ප්‍රජා ශාලාව බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් මෙම කරුණද ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත ඉදිරිපත් කර ඇති යෝජනා අංක 07:01:01 මඟින් කිසිඳු පෞද්ගලික පලිගැනීමක් අදහස් නොකරන බවත්, අවශ්‍ය වන්නේ සාධාරණ පරීක්ෂණයක් පමණක් බවත්, යෝජනා අංක 07:01:02 හි සඳහන් මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ගල්වල අසළ නායයෑමකට ලක්ව ඇති ස්ථානය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරනු ලබන දැලක් දැමීම වැනි සුදුසු ක්‍රමයක් මඟින් නායයෑම් අවධානම අවම කිරීමට මාර්ග සංවර්ධන අධිනාරිය වෙත දැනුම් දීමට යෝජනා කරන බවත්, යෝජනා අංක 07:01:03 මඟින් යෝජනා කර ඇති නිවාස සංවර්ධන අධිකාරිය සතු අනඳමෙත්ගම ප්‍රජා ශාලාව මේ වන විට කිසිඳු අලුත්වැඩියාවක් සිදු නොවන බවත්, සභාව වෙත පවරාගැනීම හා ඵලදායි ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීම සුදුසු බවත් මෙම යෝජනා ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත යොමු කිරීමටත් යෝජනා කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:02:01** නන්දන කඩය අසළ මාර්ගයේ උරහිස සකස් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ වැඩිදුර කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසු ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:03:01** ඉදිරි පොහොය දිනයක බළන්ගොඩ නගරය තුළ කාණු පිරිසිදු කිරීමට කටයුතු කිරීම.

**07.03.02** වරිපනම් ගෙවීම සම්බන්ධයෙන් හා අලුත ඉදිකිරීම් සම්බන්ධයෙන් වරිපනම් ලබාදීමට කටයුතු කරන්න.

**07.03.03** බළන්ගොඩ නගර සභා සීමාවේ ප්‍රධාන මාර්ග දෙපස අහිංසක මිනිසුන් පොඩි කඩ කාමර ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම පිළිබඳ සහ ඒ සම්බන්ධව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සභාව දැනුවත් කරන්න.

ඉහත සඳහන් යෝජනා ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් පවසා සිටියේ නගරයේ කාණු පිරිසිදු කිරීම කාලයකින් සිදු වී නොමැති බැවින් කාණු සියල්ල පිරිසිදු කිරීමට යෝජනා කරන බවත්, නව ඉදිකිරීම් සම්බන්ධයෙන් වරිපනම් අංක ලබාදීමට කටයුතු කරන ලෙසත්ය.

ගරු උප සභාපතිතුමන් පැවසූයේ වරිපනම් ඒකක පිළිබඳ මෙම දිනවල සමීක්ෂණයක් පවත්වනු ලබන බවත් ඒ අනුව එහිදී මෙම නව ඒකක පිළිබඳ අනාවරණය වනු ඇති බවත්ය.

**ගරු උප සභාපතිතුමා ප.ව.1.17 ට පමණ ගරු සභාපතිතුමා වෙත මූලාසනය භාර දෙන ලදී.**

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය ඉහත යෝජනා අංක 07.03.03 සම්බන්ධව අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා සීමාවේ ප්‍රධාන මාර්ග දෙපස පවත්නා නීත්‍යානුකුල නොවන ගොඩනැගිලි එම අයිතිකරුවන් නොදැනුවත්කම හේතුවෙන් ස්ථාවර ගොඩනැගිලි ලෙස සකස් කර ගෙන යන බවත් ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීම සුදුසු බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ එවැනි අනවසර ඉදිකිරීම් සිදු කිරීම සම්පූර්ණ නීති විරෝධී බවත් නගරයේ ඇතැම් ගොඩනැගිලි සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමැතිය ලබා දී ඇති බවත්, මේ පිළිබඳව ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ආයතන සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමආරච්චි මැතිතුමා**

**07.04.01** බළන්ගොඩ නගර මධ්‍යයෙහි කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව පිටුපස සංවර්ධනය නොකළ මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස පවතින ඉඩම් පිළිබඳ සභාවේ තීරණයක් ගැනීමට යෝජනා කරමි.

**07:04:02** බළන්ගොඩ නගර සභාවේ වාර්ෂිකව ටෙන්ඩර් නොකරන දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදී ඇති කඩ කාමර වල සිටින හඳුනාගත් අතුරු බදුකරුවන්ට සහ විවිධ සාධාරණ හේතු මත බදු අයිතිය ඉල්ලා සිටින අයට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ඇතිව බදු අයිතිය පිරිනැමීමට යෝජනා කරමි.

**07:04:03** පෙර පාසල් පාලිකා දීමනාව රු. 25,000 ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරමි.

**07.04:04** නගර සභාව සතු ඉඩම් වල පදිංචිව සිටින කිවුලෙවෙල නිවැසියන් සඳහා පදිංචි ඉඩම් වලට ඔප්පු ලබාදීමට වැඩ පිළිවෙලක් සැලසුම් කිරීමට සහ පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමට අවශ්‍ය ඔප්පු වෙනුවට ඉදිරිපත් කළ හැකි පිළිගත හැකි ලියවිල්ලක් ඔවුන්ට ලබාදීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව තම අදහස් දක්වමින් යෝජනා අංක 07.04:01 ක්‍රියාත්මක කිරීම මඟින් සභාවට ආදායමක් ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත්, බළන්ගොඩ නගර මධ්‍යයෙහි කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව පිටුපස සංවර්ධනය නොකළ මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස පවතින ඉඩම් වල ප්‍රාග්ධන වටිනාකමින් 2% ක බද්දක් අයකර ගැනීමේ හැකියාවක් පවතින බවත්, යෝජනා අංක 07:04:04 දක්වා ඇති පරිදි නගර සභාව සතු ඉඩම් වල පදිංචිව සිටින කිවුලෙවෙල නිවැසියන්ගේ ළමුන් පාසල් වලට ඇතුළත් කිරීමේදී ඔවුන්ගේ පදිංචිය සනාථ කිරීමේ ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බැවින් ඔවුනට විශාල අවාසියක් වී ඇති බවත්,සභාවට ඔප්පු ලබා දීමේ හැකියාවක් නොමැති වුවද සභාව මැදිහත් වී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා එම පදිංචිකරුවන්ට ඔප්පු ලබා දීමේ හැකියාවක් පවතින බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත 07.04.01 යෝජනාව ඉතාම වටිනා යෝජනාවක් බවත් බළන්ගොඩ නගර මධ්‍යයෙහි කොමර්ෂල් බැංකුව සහ ලංකා බැංකුව පිටුපස සංවර්ධනය නොකළ ඉඩම් රථගාලක් පවත්වා ගෙන යාම වෙනුවෙන් සභාව වෙත ලබා ගැනීමට මේ වන විට ඉල්ලුම් කර ඇති බවත්, යෝජනා අංක 07:04:04 න් දක්වා ඇති කිව්ලෙවෙල පදිංචිකරුවන් වෙනුවෙන් ඔප්පු හෝ පදිංචිය තහවුරු කිරීමේ ලේඛනයක් ලබා දීම වෙනුවෙන් සාකච්ඡා කිරීම වෙනුවෙන් මෙම ගැටළුව ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමආරච්චි මැතිතුමා ඉදිරිපත් කර ඇති පෙර පාසල් පාලිකා දීමනාව වැඩි කිරීමේ යෝජනාව ඉහත සභාපතිතුමාගේ යෝජනාවලදී සම්මත වූ බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සම්මත විය.**

**07.05 ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07.05.01** බළන්ගොඩ නගර සභා සීමාව තුළ ප්‍රධාන වශයෙන් කල්තොට මාර්ගයේ නිතර සිදුවන වාහන තදබදය සම්බන්ධව බළන්ගොඩ නගර සභා සභිකයින්ගේ සහභාගීත්වයෙන් බළන්ගොඩ පොලීසියේ රථ වාහන වාහන අංශයේ නිලධාරීන් සමග විශේෂ සාකච්ජාවක් පැවැත්වීම.

**07.05.02** බළන්ගොඩ එෆ්.එච්.මාවත ( නගර සීමාව තුළ) අලුත්වැඩියා කිරීම සහ අක්‍රීයවී ඇති විථි ලාම්පු සවිකිරීම.

**07.05.03** බළන්ගොඩ දෙහිගස්තලාව අල්මිනාරා විද්‍යාලයට පිවිසුම් මාර්ගය අබලන් වී ඇති කොටස අලුත්වැඩියා කිරීම.

**07.05.04** බළන්ගොඩ ගොරොක්ගහමඩ ප්‍රධාන මුස්ලිම් දේවස්ථානය ඉදිරිපිට මාර්ගයේ කඩ පේළියේ අතර කොටසේ මාර්ගය ඉතා අබලන් වී ඇති බැවින් කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ඉහත යෝජනා පිළිබඳව තම අදහස් දක්වමින් බළන්ගොඩ නගරයේ පවතින වාහන තදබදය විශාල වශයෙන්ම පවතින්නේ දෙහිගස්තලාව කොට්ඨාශයේ බවත් කල්තොට මාර්ගයේ බවත්, පාසල් ආරම්භ වීමට පෙර සහ සවස වරුවේ තදබදය වැඩි බවත්, ඒ අනුව බළන්ගොඩ පොලීසියේ රථ වාහන අංශයේ නිලධාරීන් සමග විශේෂ සාකච්ජාවක් පවත්වා රථවාහන තදබදය විධිමත් කළ යුතු බවත් ඉදිරිපත් කර ඇති අනෙකුත් යෝජනා කඩිනමින් සිදු කර දෙන ලෙසත් පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:06:01** තුඹගොඩ විථි අවට සැරිසරන අයාලේ යන ගවයින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් තුඹගොඩ විථි අවට සැරිසරන අයාලේ යන ගවයින් මේ වන විට විශාල ගැටළුවක් බවට පත්ව ඇති බවත්, එම සතුන් ඇතැම් විට වාහනවල හැප්පී අනතුරු සිදුවන බවත්, ඒ අනුව එම ගැටළුව විසඳීම අනිවාර්යෙන් සිදු කළ යුතු බවත් පැවසීය.
අනතුරුව ගරු සභාපතිතුමා පැවසූයේ, මෙම ගැටළුව පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීම සුදුසු බවයි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා**

**07:07:01** බළන්ගොඩ පෙට්ටිගල මාර්ගයේ සමගි වෙළඳසැල අසල සිට වෛද්‍ය සුජිත් ප්‍රියන්ත මහතාගේ නිවස දක්වා ඇති මීටර් 200 ක් පමණ වූ අතුරු මාර්ගය ප්‍රිමික්ස් හෝ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම.

**07:07:02** බළන්ගොඩ උඩකන්ද මාර්ගයේ අතුරු මාර්ගයක් වන ලාල් ගලප්පත්ති මහතාගේ නිවස අසලින් ආරම්භ වී සී.සී.දෙමළ විද්‍යාලය දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ඒකමතිකව සම්මත විය.**

**07:08 ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

**07:08:01** නාගරික සංවර්ධන අධිකාරියට අයත් බළන්ගොඩ නගර සභා සීමාව තුළ පිහිටි බස්නැවතුම්පල භූමිය සහ බළන්ගොඩ පොලීසිය අසල කොටස මේ වන විට කිසිදු ඉදිකිරීමක් හෝ සංවර්ධන කටයුත්තක් සිදුනොවන බැවින්, එම බිම් කොටස් කුළී හෝ බදු පදනම මත නගර සභාවට ගෙන නගරය තුළ දහවල් කාලයේ විවිධ ස්ථාන වල නවතා ඇති විශේෂයෙන් පාසල් බස් රථ කිසියම් මුදලක් අයකර බස්නැවතුම්පල අසල භූමියේ ගාල් කිරීමට අවස්ථාව ලබාදීමටත් පොලීසිය අසල භූමිය ඒ වටා පියස්සකින් ආවරණය කර නගරය තුළ නවතා ඇති කාර්රථ,වැන් රථ ,මෝටර් බයිසිකල් ආදිය කිසියම් මුදලක් අයකර ගාල්කර තැබීම සඳහා අවස්ථාව ලබාදීමටත් යෝජනා කරමි.

**07:08:02** ඕලුගන්තොට මඩේවත්ත උඩ පාර ඉහළ කොටසේ ටවර් එක දක්වා මීටර් 120 ක් පමණ ප්‍රමාණය කොන්ක්‍රීට් ඇතිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳව අදහස් දක්වමින් නගරයේ ප්‍රධාන වීදිය අවහිර වන්නේ රථවාහන නැවැත්වීමෙන් බවත්, ප්‍රධාන වීදිය කඩ හිමියන් වාහන නැවැත්වීම හේතුවෙන් තම ව්‍යාපාර අවහිර වීමෙන් වෙළඳාම අඩුවන බවට පවසන බවත්, ඒ අනුව මෙසේ නගරයේ තැන් තැන් වල ගාල් කරන රථවාහන නැවැත්වීම සඳහා ඉහත යෝජනා කර ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් බස්නැවතුම්පල අසළ භූමිය සහ බළන්ගොඩ පොලීසිය අසල කොටස බදු පදනම මත හෝ ලබා ගැනීම සුදුසු බවත් පවසන ලදී.

**07:09 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

**07:09:01** 2025 වර්ෂයේ බළන්ගොඩ නගර සභාවේ සහ අනුයුක්ත ආයතනවල සේවය කරන සේවක මහත්ම මහත්මීන් ඇගයීමේ සහ සුහද හමුවක් 2025 වර්ෂයේ දෙසැම්බර් මස සංවිධානය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදදින සභාවේ නොමැති බැවින් ඉදිරි දිනයකදී ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**07:09** ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තමන් කාරක සභාවන් ගණනාවක සාමාජිකත්වය දරන බැවින් මුදල් කාරක සභාවෙන් ඉල්ලා අස්වන බව පවසන ලද අතර එම පුරප්පාඩු වන මුදල් කාරක සභා සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා සුදුසු බවට යෝජනා කරන ලදී. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එකී ඉල්ලා අස්වීම සහ මුදල් කාරක සභා සාමාජිකත්වය වෙනුවෙන් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා පත් කිරීමේ යෝජනාව ස්ථිර කිරීමත් සිදු කරන ලදී.

ඒ අනුව ඉහත මුදල් කමිටු සාමාජිකත්වය වෙනස්කිරීමේ යෝජනාව විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. කාරක සභා වාර්තා සලකා බැලීම.**

2025-07-09, 2025-07-23 දිනැති මුදල් කාරක සභා වාර්තාව සහ 2025-07-15 දිනැති කර්මාන්ත කාරක සභා වාර්තාව යන කාරක සභා වාර්තා මෙදින සභාවට ඉදිරිපත් කරන ලද අතර එකී වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම.**

**2025-06-01 සිට 2025-06-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 14,167,847.30 |
| මූලධන ලැබීම් | 1,027,838.00 |
| වෙනත් ලැබීම් | 2,014,760.85 |
| මුලු ලැබීම් | 17,210,446.15 |
| පුනරාවර්තන වියදම් | 14,064,399.75 |
| ප්‍රාග්ධන වියදම් | 814,631.96 |
| වෙනත් වියදම් | 5,635,683.66 |
| මුලු වියදම් | 20,514,715.37 |

**2025-07-01 සිට 2025-07-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---:|
| 56-1906 | 11560.00 |
| 227-5020 | - |
| RD - 8240 | 41907.89 |
| 226-7521 | 29478.00 |
| BC-0005 | 86700.00 |
| GC 0001 | 12575.00 |
| LL - 7688 | 12427.00 |
| DDR 0008 | 1156.00 |
| JD-4684 | 2135.00 |
| LL-2110 | 50677.00 |
| ND-5124 | 31795.00 |
| PF-4006 | 31790.00 |
| QL-2901 | - |
| ZA 0028 | 26010.00 |
| RC-1107 | - |
| RE 2600 | 15606.00 |
| 37-7933 | - |
| RC 8183 | - |
| HF 8558 | 31473.00 |
| VI 1833 | 3660.00 |
| RB 4786 | 91848.89 |
| RC 1118 | 49,682.89 |
| ZA 5039 | - |
| GK 1483 | 29480.89 |
| RD 8000 | 52311.89 |
| DPP 0006 | 26250.00 |
| OV/M 0017 | - |
| CSM 0009 | - |
| MG 0014 | 8670.00 |
| UQ 1933 | 2135.00 |
| GK 6227 | 18785.00 |
| HF 7899 | 28900.00 |
| ZA 9835 | 107862.00 |
| **එකතුව** | **804877.62** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ටෙන්ඩර්පත් මිල ගණන් විවෘත කිරීම.**

**10.1** 2025 දෙසැම්බර් මස දක්වා කර්මාන්ත හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් විවෘත කිරීම.

2025 දෙසැම්බර් මස දක්වා කර්මාන්ත හා නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් විවෘත කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී.වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ආරියපාල මෙටල් ක්‍රෂර් සහ තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් යන සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලැබී තිබූ අතර, අවම මිල ගණන් හා කොන්දේසි ඉදිරිපත් කළ පහත සඳහන් සැපයුම්කරුවන්ගෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය මිල දී ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන් විසින්, ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළ පහත සඳහන් සැපයුම්කරුවන්ගෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය මිල දී ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

| අනු අංකය | අයිතමය | මිල රු. | සැපයුම්කරු |
|---|---|---|---|
| 01 | කලු ගල් 6" x 9" | 10,000.00 | ආරියපාල මෙටල් ක්‍රෂර් |
| 02 | කලු ගල් 4" | 14,500.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 03 | කලු ගල් 3" | 15,500.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 04 | කලු ගල් 2" | 14,700.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 05 | කලු ගල් 1" | 12,250.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 06 | කලු ගල් 1 1/2" | 12,710.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 07 | කලු ගල් ක්‍රෂර් 3/4" | 11,850.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 08 | කලු ගල් 1/2" | 12,100.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 09 | චිප්ස් 1/4 | 12,100.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 10 | ගල් කුඩු | 10,000.00 | ආරියපාල මෙටල් ක්‍රෂර් |
| 11 | ABC මිශ්‍රණය | 11,450.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 12 | ගඩොල් (9 , 4 1/2, 2 1/2) | 29.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 13 | බ්ලොක් ගල් (15 1/2, 7 1/2, 4) | 90.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 14 | බ්ලොක් ගල් (14, 14, 6 ) | 95.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 15 | අන්තර් බන්ධන කොන්ක්‍රීට් ගල් | 75.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 16 | අන්තර් බන්ධන කොන්ක්‍රීට් ගල් 25 N | 85.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 17 | අළු හුණු (25 kg) | 510.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 18 | තම්බපු අළු හුණු (25 kg) | 510.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 19 | ගංගා වැලි | 16,490.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 20 | පස් | 12,500.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 21 | බොරලු (ග්‍රැවල්) | 13,500.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 22 | පුරවපු ගල් (1, 4, 0-8,0,5) | 92.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |
| 23 | පුරවපු ගල් (1, 4, 0-8,0,4) | 93.00 | තිරණ කන්ස්ට්‍රක්සන් ඇන්ඩ් සප්ලයර්ස් |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.1 බළන්ගොඩ නගර සභාව සතු තානායම ගොඩනැගිල්ලේ මිදුල සකස් කිරීම.**

බළන්ගොඩ නගර සභාව සතු තානායම ගොඩනැගිල්ලේ මිදුල සකස් කිරීම යන කර්මාන්තය ඉටු කිරීම සඳහා මිල ගණන් විවෘත කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය රැස්වීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව උක්ත කර්මාන්තය සඳහා රසාන් පැලතවාන, ටී.එල්.ඩී ලලිත් නිශේන්ද්‍ර , ඉසුරු කෘෂි සේවා යන ආයතන වලින් මිල ගණන් ලබා දී තිබුණි.එම ආයතන වලින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් පහත පරිදි වේ.

| අනු අංකය | ආයතනයේ නම | ඉදිරිපත් කර ඇති ලංසු වටිනාකම |
|---|---|---|
| 01 | රසාන් පැලතවාන | 2,285,340.00 |
| 02 | ටී.එල්.ඩී ලලිත් නිශේන්ද්‍ර | 2,104,345.00 |
| 03 | ඉසුරු කෘෂි සේවා | 2,312,465.00 |

උක්ත කර්මාන්තය සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණයද සලකා ආයතන ඉහත 03න් ඉදිරිපත් වූ මිල ගණන් වලට අනුව අවම ලංසු මුදල ඉදිරිපත් කර ඇති ටී.එල්.ඩී ලලිත් නිශේන්ද්‍ර යන ආයතනයට කර්මාන්තය පිරිනැමීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.2 බළන්ගොඩ නගර සභාව සතු තානායම් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩවල තීන්ත ආලේප කිරීම හා අළුත්වැඩියා කිරීම.**

බළන්ගොඩ නගර සභාව සතු තානායම් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩවල තීන්ත ආලේප කිරීම හා අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය ඉටු කිරීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩල රැස්වීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

| අනු අංකය | ආයතනයේ නම | ඉදිරිපත් කර ඇති ලංසු වටිනාකම | ඉදිරිපත් කර ඇති වගකීම් කාලය |
|---|---|---|---|
| 01 | ජනක | 1,204,000.00 | වසර 02 |

| | | | |
|---|---|---|---|
| 02 | මන්දිලු ලංකා ආයතනය | 2,241,000.00 | වසර 05 |
| 03 | ලක්මිණි ලී බඩු | 2,272,000.00 | වසර 03 |

මිළ ගණන් විවෘත කිරිමේ අවස්ථාවට අංක 01 හි මිළ ගණන් ඉදිරිපත් කළ ලංසුකරු හා අංක 02 මිළ ගණන් ඉදිරිපත් කළ ලංසු කරු සහභාගි වූ අතර එහිදී, එම ආයතන වලට අදාළ පුද්ගලයින් දෙදෙනාම අදාළ කර්මාන්තය සඳහා වසර දහයක (10) වගකීම් කාලයක් ලබා දීමට වාචිකව එකඟ වූ අතර, පින්තාරු කටයුතු සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුතු තීන්ත හා ආලේප තුනීකාරක බුරුසු භාවිත කිරීමට එකඟ වූ බැවින් අඩුම මිළ ඉදිරිපත් කළ අංක 01 යටතේ ලංසු ඉදිරිපත් කළ ජනක යන අයට මිළ ගණන් කැඳවීමේදී සපයා ඇති කොන්දේසි පරිදි වැඩ කොටස් සම්පූර්ණ කිරීමටද, අදාළ පාර්ශවය සමඟ ගිවිසුම් ගත වීමටද වාචිකව එකඟ වූ පරිදි වගකීම් කාලය මාස 06ක කාලයක් සඳහා රැදවුම් මුදල රදවා ගැනීම හා ගිවිසුම් ගත මුදලින් 20% ගිවිසුම් ඇප මුදලක් තැන්පත් කිරිමට එකග විය. ඒ අනුව අවම මිළ ගණන ඉදිරිපත් කළ ජනක යන අයට තානායම් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩ තීන්ත ආලේප කිරිම හා අළුත්වැඩියා කිරිමේ කර්මාන්තය ප්‍රදානය කිරිම සුදුසු බවට, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයද සලකා සභාව තීරණය කරන ලදී.
ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් ,ජනක යන අයට තානායම් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩ තීන්ත ආලේප කිරිම හා අළුත්වැඩියා කිරිම කර්මාන්තය ප්‍රදානය කිරිම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා වෙත යොමු කරන සංදේශ පැමිණිලි පෙත්සම් සභාව වෙත ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳ සභාව දැනුවත් වන බවද, මින් පෙර පැවති සභා වාරයන් නියෝජනය කරන කාලයන්හිදී මෙම සභාවේ සේවයේ යෙදුන දැනට ස්ථානමාරු සහ විශ්‍රාම ලැබ ඇති කාර්ය මණ්ඩලය ඉතා සුහදව සේවයේ යෙදුන බැවින් ඔවුන් ගෙන්වා සුහද හමුවක් පවත්වා අගය කිරීමක් සිදු කිරීම වැනි දෙයක් කිරීමට හැකි නම් එය ඉතා වටිනා බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් තමන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කළ කල්තොට මාර්ගයේ කාණු පද්ධතිය අවහිර වීම පිළිසකර කිරීම මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ආරම්භ කර ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමාද නිතරම එම කටයුතු අධීක්ෂණය කළ බවත්, නමුත් මෙම අළුත්වැඩියාව අතරමග නතර කර ඇති බැවින් ජනතාව දුෂ්කරතා රැසකට මුහුණදෙන බවත්, ඒ අනුව ගරු සභාපතිතුමා මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කිරීම සුදුසු පවත් පැවසීය.

වැඩිදුරටත් එතුමා අදහස් දක්වමින් පවසා සිටියේ තමාගේ ඉල්ලීම සලකා බලා තලාව මාර්ගය ප්‍රිමික්ස් යෙදීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිය ප්‍රකාශ කරන බවත්, එසේම දෙහිගස්තලාව කොට්ඨාශය නියෝජනය කරමින් තමන්ව සිව්වන වරටත් බළන්ගොඩ නගර සභා නියෝජිතයෙකු ලෙස පත් කර එවූ තමාගේ කොට්ඨාශයේ ජනාතාවට අවංක ස්තුතිය පුද කර සිටින බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් බුලත්ගම සුසාන භූමියේ අත්‍යවශ්‍යයෙන් සිදු කල යුතු අලුත්වැඩියා රැසක් පවතින බවත්, එම ස්ථානයේ විශාල ලෙස ජරාජීර්ණ බවට පත්ව ඇති බවත්,එහි ශාලාවලට ජලය විදුලිය ආදි කිසිදු පහසුකමක් නොමැති බවත් ඒ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය නඩත්තු සිදු කරන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදින් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් කොට්ඨාශයේ වැඩ සිදුවද්දී කොට්ඨාශය භාර මන්ත්‍රීවරයාට ඒ බව දැනුම් දෙන ලෙසත්, නගරයට ගිය විට බොහෝ විට රථවාහන නැවැත්වීම ගාස්තු අයකිරීමේදී වාහන නවත්වන විටම අයකරන බැවින් ටෙන්ඩර්කරුවන් ගාස්තු අයකරන වේලාව අසාධාරණ බවට පැමිණිලි ලැබෙන බවත් ඒ අනුව ටෙන්ඩර්කරු ඒ පිළිබඳව දැනුවත් කරන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් තමන් කල් දී ඇති ප්‍රශ්න යටතේ ඉදිරිපත් කරන ලද තොසිල ගාර්ඩන් මාර්ගයේ අනතුරුදායක ගස ඉවත් කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමන් මින් පෙර සභා වාරයේදී යෝජනා යටතේ ඉදිරිපත් කරන ලද රත්නපුර මාර්ගයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කාණු පද්ධතිය පිළිසකර කිරීමත්, කාණු පද්ධතියේ ලෙවෙල් නැතිබව සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්,ඒ අනුව එම ආයතන දැනුවත් කරන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා තම අදහස් දක්වමින් පවසා සිටියේ සභාවේ න්‍යාය පත්‍රය සකස් කිරීමේදී ඉදිරිපත් කර ඇති ආකෘතියට වඩා විස්තරාත්මකව තොරතුරු ඇතුළත් කරන්නේ නම් සභිකවරුන් ඒ පිළිබඳ දැනුවත් වී පැමිණෙන බැවින් සභාවේ කාලය මීට වඩා ඉතිරි වන බවත් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා සහ විශේෂයෙන් සභාව සාර්ථකව පවත්වා ගෙන යාමට නිරන්තර උපදෙස් ලබා දෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී තුමන්ලා වෙතද ස්තුතිය පුදකරමින් ප.ව 2.06 ට පමණ මෙදින මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

කේ. පී.ප්‍රේමදාස,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.